# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍රහිමියන් වෙත කෙරෙන දැනුම් දීමයි.

එළඹෙන 2021 සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් 2021.04.09 දින සිට 2021.04.19 දින දක්වා කාල සීමාව තුල වැඩි මගීන් ප්‍රමාණයක් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනිම සඳහා බස්රථයන්හි ගමන් කරන බැවින් එම කාලසීමාව තුල ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබා ගෙන ඇති බලපත්‍රලාභින් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

උක්ත කාල සීමාව තුළදි,

- සෞඛ්‍ය අංශ මගින් ලබා දී ඇති උපදෙස් අනුව බස්රථ ධාවනය කළ යුතු වේ.
- මගී සේවා අවසරපත්‍රයේ සඳහන් බලපත්‍රය මගින් බලය පවරා ඇති මාර්ගයේ බස්රථය අඛණ්ඩව ධාවනය කරලීම අනිවාර්ය වේ.
- වැඩි මගී ඉල්ලුමක් පවතින මාර්ගවල ධාවන කාල සටහන් අවලංගු කරන අතර මගී අවශ්‍යතාවය මත කාලසටහන් අනුපිළිවෙල අනුව බස්රථ ධාවනය කළ යුතු වේ.
- රියදුරුගේ සේවා කාලය පැය 14 ඉක්මවන සෑම අවස්ථාවකම වෙනත් රියදුරෙකු ආදේශ කළ යුතුය.
- මගී සේවා අවසරපත්‍රය මගින් බලය ලබා දී ඇති මාර්ගයේ බස්රථය ධාවනය නොකර විශේෂ චාරිකාවන්හි බස්රථය යෙදවීම නොකළ යුතු වේ.

මෙම උත්සව කාල සීමාව තුළ උක්ත කරුණු නොසලකා කටයුතු කරන බලපත්‍රලාභීන්ගේ මගී සේවා අවසරපත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බව තවදුරටත් දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ) ගේ ජංගම දුරකථන අංක 071-8071365 ඇමතීමෙන් ලබා ගත හැක.

ශෂී වෙල්ගම<br>
සභාපති<br>
ජාතික ගමනාගමන කොමිෂන් සභාව<br>
ක්ෂණික ඇමතුම් - 1955